තැ.පෙ.
~~තපාල්~~
P.O. Box | 572

දුරකථන
தொலைபேசி
Telephone | 2430860-9
2430870-8

මගේ අංකය
எனது இல
My No | MOD/DEF/
10/18/01

ඔබේ අංකය
உமது இல
Your No

**ආරක්ෂක අමාත්‍යාංශය**, අංක: 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
**பாதுகாப்பு அமைச்சு**, இல:15/5, பாலதக்ஷ மாவத்தை, கொழும்பு -03, இலங்கை.
**MINISTRY OF DEFENCE**, No. 15/5, Baladaksha Mawatha, Colombo 03, Sri Lanka

දිනය
திகதி
Date | 2016 මැයි මස 04 දින

යුද්ධ හමුදාධිපති,

නාවික හමුදාධිපති,

ගුවන් හමුදාධිපති,

<u>ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින්ගේ වැටුප් සංශෝධනය - 2016</u>

2016.04.29 දිනැති අංක 03/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි පිටපතක් මේ සමඟ යොමු කරන අතර මෙම චක්‍රලේඛය අනුව සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින් වෙත වැටුප් ගෙවීම් සිදුකරන මෙන් දන්වමි.

02. චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම් හා වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම් මෙම අමාත්‍යාංශය හරහා අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්.හෙට්ටිආරච්චි
අතිරේක ලේකම් (ආරක්ෂක)
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

කළමනාකරණ සේවා චක්‍රලේඛ : 03/2016

මගේ අංකය: එම්.එස්.ඩී./පොදු/වැටුප්

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,

මහා භාණ්ඩාගාරය,

කොළඹ 01.

2016.04.

ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය

## ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින්ගේ වැටුප සංශෝධනය - 2016

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන පදනම් කරගෙන ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා පුද්ගලයින් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණයන් 2016.01.01 දින සිට අදියර 05කින් උපලේඛන II හි සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර ඇත.

02. නව වැටුප් ව්‍යුහය තුළ පහත සඳහන් දීමනා අන්තර්ගත කර ඇත.

(i) 2011.12.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2011 සහ 2012.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 අනුව ගෙවනු ලබන විශ්‍රාම වැටුපට හිමිකම් රහිත විශේෂ දීමනාව.

(ii) 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014, 2014.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 24/2014(I) සහ 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2015 අනුව මාසිකව ගෙවනු ලබන රු.10,000/- ක් වන අන්තර් දීමනාව.

03. වැටුප් පරිවර්තනය

03.1 දැනට පවතින වැටුප් පරිමාණයන්හි සිට නව වැටුප් පරිමාණයන්ට වැටුප් පරිවර්තනය කිරීම පියවරට පියවර තැබීමේ ක්‍රමය යටතේ සිදු කළ යුතු ය. එහෙත් මෙම වැටුප් සංශෝධනය අදියර 05ක් යටතේ සිදු කරන බැවින් උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව අනුව වැටුප් පරිවර්තනය කළ යුතු ය.

03.2 වැටුප් පරිවර්තනය කිරීමේ දී 2015.12.31 දිනට පවත්නා වැටුප් ව්‍යුහය යටතේ අදාළ වන නිලය/ශ්‍රේණිය හා ඊට අදාළ වැටුප් ක්‍රමයට අනුරූපීව මෙම චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නිලය/ශ්‍රේණිය හා අදාළ වැටුප් ක්‍රමය හඳුනාගත යුතු ය. ඒ අනුවම ඊට අදාළ උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව තෝරාගත යුතු ය.

03.3 නියමිත පරිවර්තන වගුව අනුව 2015.12.31 දිනට අදාළ වූ වැටුප් පියවරට අනුරූපී 2016.01.01 දිනට නියමිත වැටුප් පියවර අනුව අදාළ වන වැටුප් තලයෙහි පිහිටුවිය යුතු ය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම I වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘතිය උපයෝගී කර ගත යුතු ය.

03.4 ඉහත 03.3 හි අනුගමනය කළ ක්‍රමවේදය අනුවම 2017.01.01, 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 යන දිනයන් හි දී එළඹෙන වැටුප් පරිවර්තනයන් ද ඒ ඒ අවස්ථාවේ දී සිදුකළ යුතු ය. මේ සඳහා උපලේඛන II හි එක් එක් වර්ෂය යටතේ සඳහන් කර ඇති වැටුප් තලයන් අදාළ කරගත යුතු ය. මෙම පරිවර්තනය සඳහා එක් එක් වර්ෂය වෙනුවෙන් ඇමුණුම II, III, IV සහ V වශයෙන් ඇති වැටුප් පරිවර්තන ආකෘති උපයෝගී කර ගත යුතු ය.

**04. වැටුප් වර්ධකය ගණනය කිරීම**

**04.1 වැටුප් පරිමාණය තුළ වැටුප් වර්ධකය ගණනය කිරීම**

(I) 2016.01.01 දින සිට 2016.12.31 දක්වා වූ කාලය තුළ වැටුප් වර්ධකය උපයා ගන්නා අවස්ථාවේ දී ඉහත 03.3 හි පිහිටුවන ලද වැටුප් තලයට ආසන්න ඉහළ වැටුප් තලයේ පිහිටුවිය යුතු ය. ඒ අනුව 2016 වර්ෂයට නියමිත වැටුප් වර්ධකයේ වටිනාකම ලෙස සැලකිය යුත්තේ අදාළ වැටුප් තලයන් දෙක අතර වෙනස පමණක් විය යුතු ය.

උදා :- ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලාන්ස් කෝප්‍රල් III ශ්‍රේණිය සඳහා 2015.12.31 දිනට නියමිතව තිබූ වැටුප් පරිමාණයේ රු. 15,005/- වැටුප් තලය ලැබූවකු සඳහා 2016.01.01 දිනට රු. 18,212/- වැටුප් තලය අදාළ වේ. වැටුප් වර්ධක දිනය 2016.10.01 වන්නේ නම් සහ එදිනට වැටුප් වර්ධකය උපයා ගෙන ඇත්නම් වැටුප් වර්ධකය සමග ඔහුට හිමි වන වැටුප් තලය වන්නේ රු. 18,388/- වේ. ඒ අනුව 2016 වර්ෂය සඳහා වැටුප් වර්ධකය වශයෙන් රු. 176 ක් හිමි වේ.

04.2 වැටුප් පරිමාණයේ උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ලබා දීම

(I). වැටුප් පරිමාණයක උපරිමයට පැමිණි අයෙකුට උපරිමයෙන් ඔබ්බට වැටුප් වර්ධක ගෙවා තිබිය හැකි ය. එවැනි අවස්ථාවක දී 2016.01.01 දින සිට අදාළ විය යුතු වැටුප් තලය තීරණය කිරීම සඳහා උපලේඛන II හි අදාළ වැටුප් පරිවර්තන වගුවෙහි නියමිත තීරුවෙහි වැටුප් පරිමාණයේ අවසානයට ඇති වැටුප්තල දෙක අතර වෙනස වැටුප් වර්ධකය ලෙස සලකා වැටුප් පියවර ගණනය කළ යුතු ය.

(II). 2016.01.01 දිනෙන් පසුව වැටුප් පරිමාණයක උපරිමය ඉක්මවා වැටුප් වර්ධක උපයාගන්නා අවස්ථාවක දී ද ඉහත (I) හි පරිදි අදාළ වැටුප් පියවර ගණනය කළ යුතු ය.

05. දළ වැටුපෙහි ගැළපුම් දීමනාව

05.1 මූලික වැටුපට අමතරව ඉහත 02 ඡේදයෙහි සඳහන් දීමනා සමග 2015.12.31 දිනට ලද දළ වැටුප සහ මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් එක් එක් වර්ෂයට අදාළ මූලික වැටුප අතර වෙනස දළ වැටුපෙහි ගැළපුම් දීමනාවක් ලෙස ගණනය කොට එහි ඇතුළත් කර ඇත. ඒ අනුව එක් එක් වර්ෂය සඳහා නියමිත මූලික වැටුපට අමතරව ඊට අනුරූපී ගැළපුම් දීමනාව ද ගෙවිය යුතු ය. මෙම ගැළපුම් දීමනාව මෙහි ඡේද 14.1 හි සඳහන් කාර්යය හැර වෙනත් කිසිදු කාර්යයක් සඳහා වැටුපෙහි කොටසක් වශයෙන් නොසැලකිය යුතු ය.

05.2 ඉහත 04.2 හි පරිදි උපරිමයෙන් ඔබ්බට වැටුප් පියවර ගණනය කළ අවස්ථාවක දී එම පියවරට අදාළ දළ වැටුපෙහි ගැළපුම් දීමනාව ද ගෙවිය යුතු ය. මේ සඳහා පළමුව 2015.12.31 දිනට ලැබූ වැටුප්තලය හා ඉහත 02 ඡේදයේ සඳහන් කර ඇති චක්‍රලේඛ යටතේ හිමි දීමනාවන් පමණක් ඇතුළත් දළ වැටුප ගණනය කළ යුතු ය. එම වැටුප හා ඉහත 04.2 යටතේ ගණනය කරන ලද වැටුප් තලය අතර මූල්‍යමය අවාසියක් වන්නේ නම් එම අගය දළ වැටුපෙහි ගැළපුම් දීමනාවක් වශයෙන් නියමිත වැටුප්තලය සමග ගෙවිය යුතු ය.

උදා:- 2015.12.31 දින ලාන්ස් කෝප්‍රල් I ශ්‍රේණියේ රු. 18,525/- න් ඔබ්බට වැටුප් වර්ධක තුනක් (03) ක් ලබා රු. 19,035/- වැටුප් තලයේ සිටි තැනැත්තකු සඳහා 2016.01.01 දිනට අදාළ වන මූලික වැටුප සහ ගැළපුම් දීමනාව ගණනය කිරීම.

**2016.01.01 දිනට අනුරූපී මූලික වැටුප රු. 23184/- කි.**

2016 වර්ෂයට අදාළ වැටුප් වර්ධක අගය රු. 210/-යි. මෙය ආසන්න වැටුප් වර්ධක 2 අතර වෙනසයි. (22554 – 22344 = 210)

ඒ අනුව රු. 630/- ක් (210x3), රු.22,554/-ට එකතු කිරීමෙන් රු.23184/- ලබා ගෙන ඇත.

- 2016.01.01 දිනට ගැළපුම් දීමනාව රු. 9658/- කි.

  රු. 19,035/- වැටුප් තලයට අදාළ දීමනාවන් :

  15% + 5% + රු.10000 = රු.13807/-

  දීමනා සමඟ වැටුප :

  රු. 19035 + රු.13807 = රු.32842/-

  ගැළපුම් දීමනාව :

  රු. 32842 - රු.23184 = රු.9658

- ඒ අනුව 2016.01.01 දිනට ගෙවිය යුතු මූලික වැටුප = රු. 23184/-

  දළ වැටුපෙහි ගැළපුම් දීමනාව = රු. 9658/-

## 06. උසස්වීමක දී වැටුප් පරිවර්තනය කිරීම

06.1 මෙම චක්‍රලේඛය අනුව අදියර ක්‍රමය යටතේ වැටුප් පරිවර්තනය සිදු කරනු ලබන කාල සීමාව තුළ (2016.01.01 සිට 2020.01.01 දක්වා) උසස්වීම් ලබන අවස්ථාවක දී එම උසස්වීම්වලට අදාළ වැටුප් පරිවර්තනයන්හි දී උපයෝගී කර ගත යුත්තේ උපලේඛන II හි සඳහන් එම **උසස්වීම ක්‍රියාත්මක වන වර්ෂයට අදාළ තීරුවෙහි දැක්වෙන වැටුප් තලයක් වේ.**

උදා :- 2017.01.01 දින සිට R 1 -2016 වැටුප් පරිමාණයේ රු. 35570 ක වැටුපක් සහ රු. 4274 ක ගැළපුම් දීමනාවක් ලබමින් සිටි ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිනන්වරයකු 2017.03.01 දින කපිතාන් නිලයට උසස්වීමක් ලැබුවේ නම් එම නිලධරයා R 2 - 2016 වැටුප් පරිමාණයේ රු. 38333 වැටුප් තලයේ පිහිටුවා රු. 3833 ක ගැළපුම් දීමනාවක් ලබා දිය යුතු ය.

## 07. අනෙකුත් දීමනා

07.1 මෙම චක්‍රලේඛයේ 2 ඡේදයෙහි සඳහන් කර ඇති චක්‍රලේඛ මගින් ලබා දී ඇති දීමනා අන්තර්ගත කරමින් නව වැටුප් ව්‍යුහය සකස් කර ඇති බැවින් 2016.01.01 දින සිට එම දීමනා ගෙවීම නතර කළ යුතු ය.

07.2 අංක 01/2014 හා 2014.01.06 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ගෙවනු ලබන මසකට රු.7800 ක් වන ජීවන වියදම් දීමනාව තවදුරටත් ගෙවිය යුතු ය.

**08. විශ්‍රාම වැටුප්**

08.1 මෙම චක්‍රලේඛයේ වැටුප් ව්‍යුහය මත 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන සේවා පුද්ගලයින් සඳහා විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී අදාළ කරගත යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි ඔවුන් අවසාන වරට ලද වැටුප් පියවර විය යුතු ය.

08.2 උපලේඛන I හි සඳහන් වැටුප් පරිමාණයන් 2020.01.01 දින සිට සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමත් සමගම 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන සේවා පුද්ගලයින්ගේ විශ්‍රාම වැටුප ද ඒ අනුව සංශෝධනය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් පසුව නිකුත් කරනු ඇත. 2016.01.01 දින සිට 2019.12.31 දක්වා අතර කාලය තුළ දී විශ්‍රාම වැටුප් සංශෝධනයන් සිදු කරනු නොලැබේ.

08.3 අංක 05/2015 සහ 2015.02.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු. 3500ක් වන අන්තර් දීමනාව මෙම චක්‍රලේඛය යටතේ 2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ලබන සේවා පුද්ගලයින් සඳහා නොගෙවිය යුතු ය. එහෙත් අංක 37/2013 සහ 2013.12.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව විශ්‍රාමිකයන් සඳහා ගෙවනු ලබන මසකට රු. 3525ක් වන ජීවන වියදම් දීමනාව ගෙවිය යුතු ය.

**09. පාරිතෝෂිකය ගණනය කිරීම**

09.1 මෙම චක්‍රලේඛයේ වැටුප් ව්‍යුහය මත 2016.01.01 දිනෙන් පසුව පාරිතෝෂිකය ගණනය කිරීමේ දී අදාළ කරගත යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි අවසාන වරට ලද වැටුප් පියවර විය යුතු ය.

**10. වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් හෝ/සහ වැටුප මත ගෙවනු ලබන දීමනා**

10.1 කිසියම් ආයතනයක/ඒකකයක/තනතුරක සේවය කරනු ලබන සේවා පුද්ගලයින් සඳහා වැටුපෙහි ප්‍රතිශතයක් වශයෙන් හෝ/සහ වැටුප මත ගෙවනු ලබන දීමනා, දිරි දීමනා හෝ එවැනි කුමන හෝ දීමනාවක් ගෙවනු ලබන්නේ නම් එම දීමනා 2015.12.31 දිනට පැවති වැටුප පදනම් කරගෙන සිදු කළ යුතු ය. 2016.01.01 දිනට පසු එවැනි ආයතනයකට/ඒකකයකට/තනතුරකට පත්කරනු ලබන සේවා පුද්ගලයින්ට මෙම දීමනාව ගණනය කිරීම සඳහා 2015.12.31 දිනට ඔවුන්ගේ වැටුප කල්පිත වශයෙන් අදාළ කරගත යුතු ය.

**11. පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීම.**

11.1 මෙම චක්‍රලේඛයේ සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන 2020.01.01 දින දක්වා සිදු කරනු ලබන බඳවා ගැනීම්/ උසස් කිරීම්වල දී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය අදාළ කරගත යුතු ය. එහෙත් ගෙවීම් සිදුකළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි විය යුතු බැවින් ඒ බැව් ද එම පත්වීම් ලිපිවල සඳහන් කළ යුතු ය.

**12. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල්**

12.1 වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සඳහා උපලේඛන II හි සඳහන් මූලික වැටුපෙන් දායක මුදල් අයකිරීම පහත සඳහන් පරිදි විය යුතු ය.

| | | |
|---|---|---|
| නිලධාරීන් | - | 7% |
| සෙසු නිලයන් | - | 6% |

**13. වැටුප් වර්ධක දිනය**

13.1 මෙම වැටුප් සංශෝධනය හේතුවෙන් වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

**14. ණය/ අත්තිකාරම් ලබාදීමේ දී මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාව**

14.1 සේවා පුද්ගලයෙකු ණය/ අත්තිකාරම් ලබා ගැනීමේ දී සලකා බලනු ලබන 40% සීමාව ගණනය කිරීමේ දී උපලේඛන II හි සඳහන් එදිනට අදාළ මූලික වැටුප හා ගැලපීමේ දීමනාව ද අදාළ කර ගත යුතු ය.

**15. නැවත සේවයේ යෙද වූ සේවා පුද්ගලයින් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති සේවා පුද්ගලයින් සඳහා වැටුප් හා දීමනා**

15.1 විශ්‍රාම යාමෙන් අනතුරුව කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ඇති සේවා පුද්ගලයින්ට පවත්නා විධිවිධාන යටතේ ගෙවනු ලබන දීමනා වෙනත් නියමයක් කරන තුරු නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

15.2 කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවා පුද්ගලයින්ට ගෙවනු ලබන වැටුප කොන්ත්‍රාත් ගිවිසුම නැවත සංශෝධනය කරන තෙක් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය.

**16.** රාජකාරි හා නිවාඩු දුම්රිය බලපත්‍ර

16.1 පවත්නා පහසුකම් යටතේ රජයේ නිලධරයන්ට වෙන්කළ හැකි ආසන ප්‍රමාණය පිළිබඳව අදාළ බලධරයන් විමසා වෙනත් නියමයක් කරන තුරු දුම්රිය බලපත්‍ර හිමිකම සම්බන්ධයෙන් දැනට පවත්නා විධිවිධාන නොවෙනස්ව ක්‍රියාත්මක වේ.

**17.** පොදු උපදෙස්

17.1 මෙම චක්‍රලේඛය අනුව සේවා පුද්ගලයෙකුට 2016.01.01 දිනට හිමි විය යුතු වැටුප තීරණය කිරීමේ දී 2006.01.01 දින හෝ එදිනට පසුව සිදු කළ වැටුප් සංශෝධන අනුව වැටුප සැකසීම නිවැරදිව සිදු කර ඇති බවට අදාළ බලධරයන් තහවුරු කරගත යුතු ය.

**18.** වැඩිපුර ගෙවීම

18.1 මෙම උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේ දී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් සේවා පුද්ගලයෙකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම් එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම සේවා පුද්ගලයා බැඳී සිටී.

**19.** පැහැදිලි කර ගැනීම හා වැඩිදුර උපදෙස්

19.1 මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව පැහැදිලි කිරීම හා වැඩිදුර උපදෙස් අපේක්ෂා කරන්නේ නම් එවැනි ඉල්ලීම, අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01 ලිපිනය වෙත යොමු කළ යුතු ය.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති
4. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව